කොවිඩ්-19 තත්වය සමගින් රටවැසියන් සාමාන්‍ය දින චරියාවෙන් මිදී නිවෙස් වලටම වී සිටීම පිළිබඳව, පොදුවේ සමාජයේ ඇති ඒකාකෘතීන් සමගින් ලියැවුණු ලිපියක් ලංකාදීප පුවත්පතේ පළවී තිබේ. මෙය උපහාසාත්මක ලෙස ලියවූවක් ලෙසින් පෙනී යයි. එය එසේ වුවත්, මෙහි ඇති අදාළ මාධ්‍යවේදියා කළ සමීක්ෂණයක් ඔස්සේ සොයාගත්තේ යැයි කියවෙන අදහස්ද ගැටළුකාරී වන්නේ, මෙය සැබවින්ම රටේ පවුල් සියල්ල නියෝජනය කරනා නියැදියක් නොවෙන බැවිනි. රටේ සෑම පවුලකම ගෘහ ජීවිතය තුළ මෙවන් ගැටළු ඇතැයි උපකල්පනය කිරීම නිවැරදි නොවනා අතරම, එය ඒකාකෘතික කිරීමක් සහ අගතිගාමී අදහස් ජනගත කිරීමක් ලෙසින් දැක්විය හැක.

එසේම මෙම ලිපිය ආරම්භයේදීම "ගැහැණියට මොනවා කළත් හොඳක් නොපෙනේය, හැම දේකම නරකක් පෙනෙන්නේය" යනාදී වශයෙන් සඳහන් වී තිබේ. මෙය උපහාසාත්මක ප්‍රවේශයක් ලෙස ගත නොහැකි බවත්, මෙය කාන්තාව ඒකාකෘතික කිරීමක්, කාන්තාව පිළිබඳ අගතිගාමී ලෙසින් අදහස් දැක්වීමක් සහ ඒ ඔස්සේ කාන්තාව කොන් කිරීමකට ලක් කිරීමක් ලෙසින් සැලකිය හැකි බවත් අපගේ මතය වෙයි.

ජනමාධ්‍යවේදියෙකු උපහාසාත්මක ස්වරයකින් හෝ විනෝදාත්මක ස්වරයකින් හෝ යම් කිසි ලිපියක් ලිවීමේදී පවා, මෙවැනි කොන් කිරීමේ, අගතිගාමී ලෙසින් සැලකීමේ හා ඒකාකෘතික ලෙසින් සැලකීමේ අදහස් සමාජගත නොකිරීමට ප්‍රවේසම්කාරී විය යුතු නොවේද? එය ජනමාධ්‍යයේ වගකීමක් නොවන්නේද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

**#MediaEthicsSL #lka #SinhalaPress #News #COVID19 #Coronavirus #SundayLankadeepa**